**ශීර්ෂය 02 - අග්‍රාමාත්‍ය කාර්යාලය**

-------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **විගණන මතය**

----------------

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **විගණන මතය සඳහා පදනම**

-------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක.

(ආ) අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 33 කට අදාලව එක් එක් වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරිකිරීම් සියයට 21 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණු අතර එම ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් විය. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීම කළ යුතු වීම. | වියදම් අවම වන ආකාරයට කළමනාකරණය කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකම පියවර ගැනීම හා අපේක්ෂිත වියදම් පැන නොනැගීම මෙන්ම පාලනය කල නොහැකි තත්වයක් මත සැලසුම්ගත කටයුතු ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු වී ඇති බව. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු. 177,000,000 ක පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන තිබුණද අතර එම ප්‍රතිපාදනයෙන් සියයට 67 ක් ඉතිරි කර තිබුණි. | - එම - | පාලනය කල නොහැකි තත්වයන් හේතුවෙන් සැලසුම් ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම් පැන නැගී ඇති බව. |

**2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩ තහනම් කළ නිලධාරීන් ගෙන් වසර 02 ක කාලයක සිට අයවිය යුතු රු. 202,366 ක ණය ශේෂයක් පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව හිඟ ණය මුදල් අප්‍රමාදව අයකළ යුතු වීම. | රු.199,866 ක් වන ආපදා ණය ශේෂය හා පොළිය 2019 මැයි සිට ණයකරුගේ ඇපකරුවන් දෙදෙනාගෙන් අයකර ගැනීමට කටයුතු ආරම්භ කර ඇති බවත් උත්සව අත්තිකාරම් මුදල වූ රු.2,500 ක මුදල පියවීමට කටයුතු කරන ලෙස නිලධාරිනිය දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ග්‍රාම රාජ්‍ය ඒකක 2500 පිහිටුවීමේ සහ පොදු සේවා සැපයුම් අධිකාරිය (Public Service Delivery Authority) පිහිටුවීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කල යුතුවීම. | ප්‍රමුඛ පදනම මත වෙනත් විවිධ වැඩසටහන් හා කාර්යයන් ඉටුකිරීමට සිදු වූ හෙයින් මේ සම්බන්ධව කරුණු ඉදිරියට පවත්වාගෙන යාමක් සිදුවී නොමැති බව. |
| (ආ) සහස්‍ර අභියෝගිතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලය (Millenium Challenge Corporatin Project Office) මඟින් ඉඩම් පරිපාලන ව්‍යාපෘතිය හා ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක | - එම - | ව්‍යාපෘතියට අදාලව හඳුනාගෙන තිබූ ක්‍රියාකාරකම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර එහි සඳහන් පරිදි සැලසුම් කර තිබූ මූලික ගිවිසුම හා ව්‍යාපෘති යෝජනා විශ්ලේෂණය කර 2018 ක්‍රියාකාරකමක් ලෙස ඇතුලත් කර අනුමැතිය ලබාගෙන ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට අවශ්‍ය ගිවිසුම් 2018 දෙසැම්බර් මස අත්සන් කිරීමට නියමිතව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | ජාත්‍යන්තර සහයෝගිතා වර්ධන කාර්යය යටතේ මූල්‍ය කාර්යසාධනය සියයට 4 ක් පමණ විය. | - එම - | වර්ෂය තුල ඉටුකරනු ලබන කාර්යයන් සම්බන්ධ පෙර සැලසුම් කල හැකි තොරතුරු ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 02 ලෙසද කාර්යසාධන වාර්තාවේ 03 වන පරිච්ඡේදය මඟින් ප්‍රගතියද වාර්තා කිරීමට කටයුතු කර ඇති බව. |
| (ඇ) | ජාතික සංහිඳියාව ආගමික කටයුතු හා සමාජ සේවා කාර්යය යටතේ මූල්‍ය කාර්යසාධනය සියයට 47 ක් පමණක් වී තිබුණි. | - එම - | ඇස්තමේන්තු හා එමඟින් කරන ලද රු.මිලියන 26.1 ක මුදලට අදාලව ඉටුකරන ලද කාර්යසාධනය 05 වන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇති බව. |

**4. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මුළු අනුමත කාර්යමණ්ඩල සංඛ්‍යාවෙන් 87 ක් හෙවත් සියයට 25 ක් පුරප්පාඩුව පැවති අතර මේ අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක පුරප්පාඩු 10 ක් එනම් සියයට 11 ක් පැවති බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පැවතීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැතිනම් එම තනතුරු අහෝසි කිරීමට කටයුතු කළ යුතු වීම. | අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් නිරන්තර අවධානය යොමුකර අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට කටයුතු යොදා ඇති බව. |